නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**12 ශ්‍රේණිය**

## මානුෂ භූගෝල විද්‍යාව

**(ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ)**

**ඒකක පරීක්ෂණය - 02**

**එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් සුදුසු හෝ පිළිතුර තෝරන්න.**

(1) ශ්‍රී ලංකාවේ පුරාණ ගමක ප්‍රධාන සංරචක වන්නේ

i. ජනාවාසය වැව, පුරාණ වෙල, හේන් හා උස්බිම්

ii. පැරණි කුඹුරු, ජනාවාස, නිවාස හා වනාන්තර

iii. ජනාවාස වැව, අලුත් වෙල, හේන් හා වනාන්තර

iv. ගංගා, වැව, කුඹුර, හේන හා වනාන්තර

v. වැව, මාර්ග, පුරාණ වෙල, වනාන්තර හා හේන

(2) පුරවරයක් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ මින් කුමක් ද?

i. නාගරික හරය

ii. උපනගර

iii. ගැමිරික කලාප

iv. කුඩා නගර

v. නාගරික සමූහිත

(3) තෘතීක ආර්ථික ක්‍රියාකාරකමක් දක්වෙන්නේ පහත සඳහන් කුමන පිළිතුරෙහි ද?

i. හස්ත කර්මාන්ත ශිල්පියෙකුසේ වැඩ කිරීම.

ii. බස් රියදුරෙකු සේ වැඩ කිරීම.

iii. ටින්මාළු ඇසුරුම් කම්හලක වැඩකිරීම.

iv. යකඩ හා වානේ කර්මාන්ත ශාලාවක වැඩකිරීම.

v. ගොවියෙකු ලෙස වගාව සඳහා බිම් සකස්කිරීම.

(4) "සළ" ගොවිතැන් ක්‍රමය වඩාත් නිවැරදි ලෙස විස්තර කරන්නේ පහත දැක්වෙන කුමන වගන්තියෙහි ද?

i. වසර කිහිපයක් වගාකොට එය අත්හැර වෙනත් භූමියක් තෝරා වගා කෙරෙන පාරිභෝගික ගොවිතැන් ක්‍රමයකි.

ii. වෙළඳපොළ ඉල්ලුම අනුව වසරින් වසර භෝගය වෙනස් කරන ඒක බෝග වගාක්‍රමයකි.

iii. එකම භූමියක බෝග වගාව ද සත්ව පාලනයද කරගෙන යන සියුම් ගොවිතැන් ක්‍රමයකි.

iv. නිවර්තන ප්‍රදේශවල හෙල්මළු ක්‍රමයට වගා කරන ගොවිතැන් ක්‍රමයකි.

v. එක් ගොදුරුබිමක සිට තවත් ගොදුරුබිමක් කරා සත්වයින් ගෙන යන සංක්‍රාමී කෘෂිකර්මික ක්‍රමයකි.

(5) "අයිනු" (Ainu) ආදිවාසී ජනයා වාසය කරනු ලබන රටවන්නේ

i. ඉන්දියාවය

ii. දකුණු අප්‍රිකාවය

iii. නසීලන්තය

iv. ඕස්ට්‍රේලියාව

v. ජපානය

(6) ප්‍රථමික ආර්ථික කටයුතු ලෙස හඳුනාගෙන ඇති කාර්යයන් සහිත පිළිතුරු කුමක් ද?

i. ගොවිතැන, වෙළඳාම, සත්වපාලනව, දඩයම් කිරීම.

ii. ගොවිතැන, සතුන් ඇතිකිරීම, පළවැලනෙලීම, දඩයම් කිරීම.

iii. ගොවිතැන, වානිජ භෝග වගාව, සත්ව පාලනය, හේන්වගාව.

iv. ගොවිතැන, ධීවර කර්මාන්තය, දඩයම් කිරීම.

v. ගොවිතැන, කිරිපට්ට පාලනය, සළ ගොවිතැන, මසුන් මැරීම.

(7) ශ්‍රී ලංකාවේ වැව් ජනාවාස පිහිටා තිබෙන්නේ

i. කඳුකර ඉහල කලාපයේය

ii. තෙත් කලාපයේය

iii. වියළි කලාපයේ

iv. කඳුකර නිම්න කලාපයේ

v. වෙරළබඩ කලාපයේ

(8) නාගරික ජනාවාස හා ග්‍රාමීය ජනාවාස ලක්ෂණ සම්මිශ්‍රණය වූ ජනාවාසය

i. නාගරික
ii. ග්‍රාමීය
iii. වතු
iv. ගැමිරික
v. ධීවර

(9) "මොෂාව්" (Moshav) යනු

i. ඉන්දුනිසියාවේ අඩු අදායම් ලාභින් සඳහා පිහිටුවා ඇති ජනාවාසයකි.
ii. ඊශ්‍රාලයෙහි පිහිටි න්‍යෂ්ටික ජනාවාසයකි.
iii. ඉස්ලාමාබාද්හි පිහිටි පැල්පත් ජනාවාසයකි.
iv. බටහිර අප්‍රිකාවේ පිහිටි තාවකාලික ජනාවාස වර්ගයකි.
v. හිමාලයේ සකායි ගෝත්‍රික ජනාවාසයකි.

(10) ජනාවාසයක තිබිය යුතු මූලිකාංග නම්

i. මිනිසා, ආවරණ, පරිසරය, සමාජය, දැලිස්
ii. මිනිසා, ආර්ථිකය, මාර්ග, ජලය, නිවාස
iii. මිනිසා, විදුලිය, ජලය, ගම්ගොඩ, කුඹුර
iv. මිනිසා, ප්‍රවාහනය, වැව, කුඹුර, සමාජය
v. මිනිසා, නිවාස, ජලය, මාර්ග, ආහාර

**දී ඇති ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) (i) නාගරික ජනාවාසක කැපීපෙනන ලක්ෂණ මොනවාද ?

(ii) ශ්‍රී ලංකා ආකෘති සිතියමක පහත දී ඇති නාගරික ජනාවාස ලකුණු කොට නම් කරන්න.
(පේදුරුතුඩුව, වව්නියාව, අනුරාධපුරය, පුත්තලම, මහනුවර, රත්තනපුර, මාතර, බණ්ඩාරවෙළ, අම්පාර, මඩකලපුව)

(iii) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතෙහි විශාල නාගරික ජනාවාස ඒකරාශී වීමට හේතු සාධක හතරක් සාකච්ඡා කරන්න.

(2) (i) පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාස වල ජන විද්‍යාත්මක ලක්ෂණ සහ ආර්ථික කටයුතු උදාහරණ සපයමින් විස්තර කරන්න.

(a) පහත රට වියලි කලාපයේ සාම්ප්‍රදායික වැව් ගම්මාන.

(b) මධ්‍යම කඳුකර වතු ජනාවාස.

(c) මධ්‍යම කඳුකර නිම්න ගම්මාන.

(ii) ශ්‍රී ලංකාවේ තෝරාගත් නාගරික නොවන ජනාවාස වල රැකියා ව්‍යුහය - 2010

| ග්‍රාම නිළධාරි කොට්ඨාශය | රැකියා ව්‍යුහය (ප්‍රතිශතය) | | |
|---|---|---|---|
| | ප්‍රාථමික | ද්විතියික | තෘතීයික |
| 324 | 7.50 | 25.00 | 67.50 |
| 893 | 95.00 | 1.00 | 4.00 |
| 885 | 88.50 | 6.25 | 6.25 |
| 863 | 94.00 | 2.48 | 3.52 |
| 320 A | 13.00 | 35.00 | 52.00 |
| 310 A | 11.60 | 25.60 | 62.80 |

(a) රැකියා ව්‍යුහය පදනම් කරගෙන වගුවෙහි දක්වා ඇති නාගරික නොවන ජනාවාස කොටස් දෙකකට බෙදා ඒවා නම් කරන්න.

(b) ඔබ හඳුනාගත් ඒ ජනාවාස දෙකෙහි රැකියා ව්‍යුහයේ කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ විශාල නගර අවට පිහිටි ග්‍රාමීය ජනාවාසවල ජන විද්‍යාත්මක හා භූමිපරිභෝගන රටාව නාගරීකරණය නිසා වෙනස්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(3) (i) ශ්‍රී ලංකාවේ විවිධ ග්‍රාමීය ජනාවාස වර්ගීකරණය කරන්න.

(ii) එම ජනාවාස 4 ක් දක්වා ඒවායේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

(iii) ලෝකයේ විවිධ ග්‍රාමීය ජනාවාස උදාහරණ සහිතව විස්තර කරන්න.